# මාධ්‍ය නීති

## ජනමාධ්‍යවේදීන්ගේ නීති අත්පොත

MEDIA LAW FORUM

# මාධ්‍ය නීති

**ජනමාධ්‍යවේදීන්ගේ නීති අත්පොත**

# මාධ්‍ය නීති
## ජනමාධ්‍යවේදීන්ගේ නීති අත්පොත

පළමු මුද්‍රණය
2023 පෙබරවාරි

ISBN 978-624-6375-00-3

සම්පාදනය
**නීතිඥ ජගත් ලියන ආරච්චි**

කවර නිර්මාණය සහ පිටු සැකසුම්
**රොෂාන් සෙනරත්**
FIRST NEED 0778604144

මුද්‍රණය
**ඩිෂයින් සිස්ටම්**
අංක 93, හික්කඩුව ශ්‍රී සුමංගල මාවත,
කොළඹ 10.
දුරකථන 0112694745

ප්‍රකාශනය
**මාධ්‍ය නීති සංසදය**
අංක 170, පළමු මහල,
අලුත්කඩේ වීදිය, කොළඹ 12.
දුරකථන-0743070888
Info@medialawforum.org
prabodha@medialawforum.org

# මාධ්‍ය නීති

## ජනමාධ්‍යවේදීන්ගේ නීති අත්පොත

MEDIA LAW FORUM

**මාධ්‍ය නීති සංසදය**

අංක 170, පළමු මහල,
අලුත්කඩේ වීදිය, කොළඹ 12.

# මාධ්‍ය නීති සංසදයෙන්....

වර්තමානය වන විට ජනමාධ්‍ය ක්ෂේත්‍රය සාම්ප්‍රදායික මාධ්‍යයේ සිට නව මාධ්‍ය සහ සමාජ මාධ්‍ය දක්වා වන පුළුල් වපසරියක ව්‍යාප්තව තිබේ. මේ හේතුවෙන්ම මාධ්‍ය ක්ෂේත්‍රයේ නිරතවූවෝ ද වෘත්තීය ජනමාධ්‍යවේදීන්ගේ සිට වෙනත් විවිධාකාරයෙන් ඒ සමග සම්බන්ධ වී සිටින මාධ්‍ය ක්‍රියාකාරිකයන් දක්වා වූ පරාසයක විහිදී සිටිති. මෙම පසුබිම තුළ මාධ්‍ය නිදහස අභියෝගාත්මක කරුණක් බවට පත්වී ඇති අතර ඒ සම්බන්ධ සිදුවීම් වාර්තාවීම ද කැපී පෙනෙන ලෙස ඉහළ ගොස් තිබේ.

මෙම සමස්තය පිළිබඳ අවධානය යොමු කරද්දී, ජනමාධ්‍යවේදීන් සහ මාධ්‍ය ක්‍රියාකාරීන් තුළ මාධ්‍ය නීතිය පිළිබඳ සාක්ෂරතාවය ඉහළ නැංවීම මාධ්‍ය නිදහස ආරක්ෂා කර ගැනීමේ වඩාත් වැදගත් පියවරක් ලෙස හඳුනාගනු ලැබ තිබේ. ඒ අනුව මාධ්‍ය  නීති සංසදය විසින් මාධ්‍ය නීතිය පිළිබඳ සාක්ෂරතාවය ඉහළ නැංවීම සඳහා විවිධ වැඩසටහන් ගණනාවක් දියත් කර ඇති අතර ජනමාධ්‍යවේදීන්ගේ නීති අත්පොත එහි තවත් එක් පියවරකි.

පුළුල් විෂය ක්ෂේත්‍රයක් වන මාධ්‍ය නීතිය කුඩා අත් පොතකට ලඝු කිරීම පහසු කරුණක් නොවේ. ඒ හේතුවෙන් එදිනෙදා මාධ්‍යකරණයේ දී වැදගත් වන නීති පිළිබඳ සරළ එහෙත් තීරණාත්මක අවබෝධයක් සහ හැඳින්වීමක් සිදුකිරීමට මෙමගින් උත්සහ දරනු ලැබ තිබේ. ඊට අමතරව යම් ගැටලුකාරී අවස්ථාවක දී සහන ලබාගත හැකි පාර්ශ්ව සහ ඒ සමග සම්බන්ධ විය හැකි ආකාරය පිළිබඳව ද තොරතුරු මෙහි ඇතුළත් වේ.

පුළුල් විෂය පථයක් කුඩා පොත් පිංචකට සංක්ෂිප්ත කිරීමේ අභියෝගය සාර්ථක ලෙස ජය ගනිමින් මෙය සම්පාදනය කළ නීතිඥ ජගත් ලියන ආරච්චි මහතාට මාධ්‍ය නීති සංසදයේ විශේෂ ස්තුතිය හිමිවේ. එමෙන්ම කවර නිර්මාණය සහ පිටු සැලසුම් කළ රොෂාන් සෙනරත් මහතාටත් මුද්‍රණ කටයුතු සිදුකළ ඩිෂයින් සිස්ටම් ආයතනයටත් .

රටේ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසට සිදුවන ඕනෑම අවහිරයකදී ස්වේච්ඡාවෙන් සිය සේවය සලසන මාධ්‍ය නීති සංසදයේ නීතිඥ මණ්ඩලයටත්, මේ අත් පොත සඳහා පිරිවැය දැරූ ඉන්ටර්නිවුස් ආයතනයටත්, මෙය සැකසීමේ කටයුතුවලට නන් අයුරින් දායක වූ මාධ්‍ය නීති සංසදයේ අධ්‍යක්ෂවරුන් සහ කාර්ය මණ්ඩලය ඇතුළු සෙසු සියලු දෙනාටත් ස්තුතිවන්ත වෙමු.

මේ පොත් පිංච පිළිබඳ ඔබගේ අදහස් අපට වැදගත් වන අතර info@medialawforum.org ඊ ලිපිනය ඔස්සේ ඒ පිළිබද ඔබගේ අදහස් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිමු. එම අදහස් මෙහි ඉදිරි සංස්කරණයන් පොහොසත් කිරීමට දායක වනු ඇත.

එමෙන්ම ජනමාධ්‍ය සහ අදහස් ප්‍රකාශ කිරීම සම්බන්ධයෙන් මතුවන ඕනෑම ගැටලුවකදී ඔබට අවශ්‍ය නෛතික සහය ලබාදීමට අප සූදානම් බව සිහිපත් කරන අතර ඒ සඳහා පැය විසිහතර පුරා ක්‍රියාත්මක අපගේ 0743070888 දුරකතන අංකය සමග සම්බන්ධ වන ලෙස ද දැනුම් දෙමු.

**නීතිඥ විරංජන හේරත්**
සභාපති-මාධ්‍ය නීති සංසදය

**නීතිඥ ප්‍රබෝධ රත්නායක**
මෙහෙයුම් අධ්‍යක්ෂ-මාධ්‍ය නීති සංසදය

contents

# අන්තර්ගතය


**1.** ජනමාධ්‍ය සඳහා අදාලවන නීතිමය සංකල්ප ........ 13

**2.** මාධ්‍ය නිදහස හා බැඳුණු මූලික අයිතිවාසිකම් ........ 15

**3.** ජනමාධ්‍යයේ පළ නොකළ යුතු දේ ........ 19

**4.** මැතිවරණ සමයේදී ජනමාධ්‍ය භාවිතය ........ 25

**5.** ජනමාධ්‍ය නියාමන නීති ........ 27

**6.** ජනමාධ්‍ය ආචාර ධර්ම ........ 31

**7.** සිවිල් අපහාසය ........ 37

**8.** සමාජ මාධ්‍ය ප්‍රකාශයන්ට අදාළ විශේෂ නීති ........ 39

**9.** ජනමාධ්‍යවේදීන් මුහුණ දෙන නීතිමය අභියෝග ........ 43

**10.** ගැටුම් වාර්තාකරණයට අදාළ සුවිශේෂී අභියෝග ........ 49

**11.** අත්අඩංගුවට ගැනීම පිළිබඳ නීති තත්ත්වය ........ 51

**12.** මාධ්‍ය නිදහස අභිබවීමකදී ගත හැකි නීතිමය පියවර ........ 57

**13.** සහන ලබාගත හැකි ආයතන ........ 59

**14.** අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය සඳහා වූ එක්සත් ජාතීන්ගේ ආයතන ........ 61

**15.** අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය වෙනුවෙන් කටයුතු කරන ජාත්‍යන්තර සංවිධාන ........ 65

**16.** ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක මාධ්‍ය සංවිධාන ........ 67

**17.** අවශ්‍ය විය හැකි වෙබ් අඩවි ........ 69

**18.** හදිසි ඇමතුම් අංක ........ 70



# 1.

# ජනමාධ්‍ය සඳහා අදාලවන නීතිමය සංකල්ප

**මූලික අයිතිවාසිකම් පිළිබඳ නීති**

**නියාමන නීති**

**අපරාධ නීති**

**මහජන ආරක්ෂක නීති**

**බුද්ධිමය දේපළ නීතිය**

**අපහාස නීති**

**මැතිවරණ නීති**

**පාරිභෝගික ආරක්ෂක නීති ක්ෂේත්‍රය**

**වෘත්තීය ආචාරධර්ම (රීති)**

# සටහන්

# 2.

# මාධ්‍ය නිදහස හා බැඳුණු මූලික අයිතිවාසිකම්

සියලුම මාධ්‍යවේදීන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ සඳහන් වන මූලික අයිතිවාසිකම් සඳහා හිමිකම් ලබන අතර, මාධ්‍යවේදීන්ගේ වෘත්තීය ස්වභාවය අනුව එයින් මූලික අයිතිවාසිකම් කිහිපයක් වැඩි සම්බන්ධතාවක් දක්වයි.

එනම්

## අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය

මාධ්‍යවේදීන් සිදුකරනු ලබන්නේ අදහස් ප්‍රකාශ කිරීමක් සහ තොරතුරු බෙදාහැරීමක් වන බැවින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1) (අ) ව්‍යවස්ථාවේ සඳහන් වන "සෑම පුරවැසියකුටම භාෂණය ඇතුළු අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසට හිමිකම් ඇත්තේය" යන මූලික අයිතිවාසිකම ඉතාමත් වැදගත් වේ.

## නීත්‍යනුකූල වෘත්තියක නියැළීමේ අයිතිය

මාධ්‍යවේදය යනු නීතියානුකූල වෘත්තියකි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1)(උ) ව්‍යවස්ථාව මගින් "සෑම පුරවැසියකුටම එකළාව හෝ අන් අය හා සමග යම් නීත්‍යනුකූල රැකියාවක, වෘත්තියක,

කර්මාන්තයක, වෙළෙඳ ව්‍යාපාරයක හෝ ව්‍යවසායක නියුක්ත වීමේ නිදහසට හිමිකම ඇත්තේ ය" යනුවෙන් සහතික කිරීම මගින් මාධ්‍යවේදියකුගේ වෘත්තීය අයිතිවාසිකම ආරක්ෂා කර තිබේ.

## තොරතුරු දැනගැනීමේ අයිතිය

ජනමාධ්‍යවේදියකුගේ කාර්යය සඳහා තොරතුරු සඳහා වන ප්‍රවේශය ඉතාමත් වැදගත් වේ. එය මාධ්‍යවේදියකුගේ කාර්යය සමග සෘජුවම සම්බන්ධවේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(අ) ව්‍යවස්ථාව මගින් " සෑම පුරවැසියකුටම පොදු අධිකාරි භාරයේ පාලනයේ හෝ සන්තකයේ පවත්නා තොරතුරු සඳහා ප්‍රවේශ වීමේ අයිතිය" පවතින බව දැක්වේ.

මෙම අයිතිවාසිකම ක්‍රියාවට නැංවීම සඳහා 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත පාර්ලිමේන්තුව විසින් සම්මත කර තිබේ. ඒ අනුව එකී පනතේ විධිවිධාන භාවිත කරමින් ඕනෑම පොදු අධිකාරියක භාරයේ පාලනයේ හෝ සන්තයේ පවතින තොරතුරුවලට එකී පනතේ 5 වන වගන්තියේ ප්‍රතිපාදනවලට සීමාවෙමින් ප්‍රවේශවීමේ අයිතිය මාධ්‍යවේදීන්ටද හිමි වේ.

එම පනත අනුව අවශ්‍ය තොරතුරු පොදු අධිකාරියේ තොරතුරු නිලධාරී වෙතින් ලිඛිතව ඉල්ලා සිටිය යුතු අතර, තොරතුරු නිලධාරියා වැඩකරන දින 14ක් ඇතුළත එම තොරතුරු ලබාදිය හැකිද? නැද්ද? යන්න පිළිබඳව ඉල්ලුම්කරුට දැනුම් දිය යුතුය.

තොරතුරු නිලධාරියාගේ එම ප්‍රතිචාරයෙන් සෑහීමකට පත් නොවේ නම් හෝ ප්‍රතිචාර නොලැබෙන්නේ නම් ඒ පිළිබඳව අභියාචනයක් ඊළඟ දින 14 තුළ එම පොදු අධිකාරියේම නම් කළ නිලධාරී වෙත යොමුකළ යුතුය. එම නම්කළ නිලධාරියා දින 21ක් තුළ  අභියාචනය පිළිබඳව තම තීරණය අභියාචකට දැන්විය යුතුය. එම තීරණයෙන් තෘප්තිමත් නොවේ නම් හෝ නම් කළ නිලධාරී ප්‍රතිචාර නොදක්වන්නේ නම් ඊළඟ මාස දෙකක කාලය තුළ තොරතුරු අයිතිවාසිකම් කොමිෂන් සභාවට අභියාචනයක් සිදුකළ හැකිය. කොමිෂන් සභාවේ තීරණයට එරෙහිව අභියාචනාධිකරණයට අභියාචනයක් සිදුකළ හැකිය.

## මූලික අයිතිවාසිකම්වල සීමාවන්

ඉහත සඳහන් කළ මූලික අයිතිවාසිකම් භුක්ති විඳීමේදී "ජාතික ආරක්ෂාව රටේ යථා පැවැත්ම ආරක්ෂා කිරීම, ජාතික සමගිය, වාර්ගික හා ආගමික සහයෝගිතාව,මහජන සෞඛ්‍යය හෝ සදාචාරය,අන්‍යයන්ගේ අයිතිවාසිකම් හා නන් වැදෑරුම් නිදහස, ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පොදු සුභසාධනය, පාර්ලිමේන්තු වරප්‍රසාද, අධිකරණයට අපහාස කිරීම  සඳහා නීතියෙන් නියම කළ හැකි සීමාවන්ට යටත්ව" එම අයිතිවාසිකම් භුක්ති විඳීම සහ ක්‍රියාත්මක කළ යුතුය,

මෙහිදී "නීති" යනුවෙන් හඳුන්වන්නේ පාර්ලිමේන්තුව විසින් පනවන නීති සහ රාජ්‍ය ආරක්‍ෂක නීතියක් යටතේ පනවන ලද නියෝගයන්ය. වෙනත් ලිඛිත නීති මගින් මෙම අයිතිවාසිකම් සීමා කළ නොහැක.

## මූලික අයිතිවාසිකම් උල්ලංඝනයකදී ප්‍රතිකර්ම

රජයේ විධායක හෝ පරිපාලන ක්‍රියාවක් මගින් මූලික අයිතිවාසිකම් උල්ලංඝනයක් සිදුවන අවස්ථාවකදී හෝ එයට අත්‍යාසන්න අවස්ථාවකදී එකී මූලික අයිතිවාසිකම් කඩවීම නිසා තමන්ට සිදුවූ හානිය වළක්වා ගැනීම සහ හානිය වෙනුවෙන් වගකිවයුතු පාර්ශ්වයෙන් වන්දි ලබාගැනීම සඳහා යොමුවිය හැකි ආයතන 3ක් පවතී.

- ශ්‍රේෂ්ඨාධිකරණය
- ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
- ඔම්බුඩ්ස්මන්

(මෙම ආයතන මගින් සහන ලබාගැනීම පිළිබඳ විස්තර සඳහා 12 වැනි පරිච්ඡේදය බලන්න)

# 3.

# ජනමාධ්‍යයේ පළ නොකළ යුතු දේ

මූලික අයිතිවාසිකමක් වන අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය කිසිදු සීමාවකින් තොරව භාවිත කළ හැකි පරම අයිතියක් නොවේ. ඒ අනුව ශ්‍රී ලංකාවේ පවතින නීතිරීති අනුව පහත සඳහන් කරුණු ජනමාධ්‍ය ඔස්සේ පළ කිරීම තහනම් වේ.

## අසභ්‍ය ප්‍රකාශන

දණ්ඩ නීති සංග්‍රහයේ 285 වන වගන්තිය සහ අසභ්‍ය ප්‍රකාශ ආඥා පනතේ 2(අ) වගන්තියට අනුව ජනමාධ්‍ය තුළ අසභ්‍ය ප්‍රකාශන පළ කිරීම වරදක් වේ.

## ආගමික අපහාසකාරී ප්‍රකාශන

දණ්ඩ නීති සංග්‍රහයේ XV වන පරිච්ඡේදයට සහ ආගමික අපහාසකාරී ආඥා පනතේ 02 වගන්තියට අනුව යම් ආගමකට හෝ ආගමික සංකේතයකට හෝ ආගමික ශාස්තෘවරයකුට අපහාසයක් වන ප්‍රකාශයක් ජනමාධ්‍ය තුළ පළකිරීම වරදක් වේ.

## වෛරී ප්‍රකාශන

සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් සම්මුතිය පනතේ 3(1) වගන්තියට අනුව සහ ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය අනුව ආගමික හෝ ජාතික වෛරය පැතිරවීම වරදක් වේ.

## ලිංගික අතවරයක වින්දිතයකුගේ අනන්‍යතාව හෙළිදරව් වන ප්‍රකාශන

දණ්ඩ නීති සංග්‍රහයේ 365(ඇ) වන වගන්තිය අනුව ලිංගික අපරාධයකට ලක්වූ වින්දිතයකුගේ අනන්‍යතාව හෙළිදරව්වන ආකාරයට ජනමාධ්‍ය තුළ මාධ්‍ය වාර්තාවන් පළ කිරීම වරදක් වේ. නමුත් අපරාධමය කරුණක් අනාවරණය කර ගැනීම සඳහා පොලිස් ස්ථානාධිපතිවරයකුගේ ඉල්ලීම මත එවැනි පළකිරීමක් සිදුකළ හැකිය.

## ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනත යටතේ නඩුවල පාර්ශ්වයන් හෙළි කිරීම

ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනතේ 20 වන වගන්තිය දක්වන්නේ එම පනත යටතේ පැවැති නඩුවක ඉල්ලුම්කරුගේ හෝ වගඋත්තරකරුගේ අනන්‍යතාව හෙළිදරව් වන ආකාරයේ ප්‍රකාශයන් පළකිරීම වරදක් බවයි.

## ළමයින්ට සහ යෞවනයන්ට හානිකර ප්‍රකාශන

1956 අංක 48 දරන ළමා හා යෞවන (හානිකර ප්‍රකාශන) පනත මගින් ළමයින්ට හා යෞවනයන්ට හානිකර වන ප්‍රකාශ පළකිරීම තහනම් කර ඇත. ඒ අනුව අවුරුදු 16ට අඩු යෞවනයකුගේ අතට පත් වීමෙන් ඔහු දූෂණය වීමට ආධාර වන පහත කරුණු ඇතුළත් ප්‍රකාශ පළ නොකිරීමට වගබලා ගත යුතුය.

(අ) අපරාධයක් සිදුකිරීම පිළිබඳව

(ආ) ප්‍රචණ්ඩ ක්‍රියා හෝ කෲරත්වය පිළිබඳව

(ඇ) පිළිකුල් හෝ භයංකර සිදුවීම් පිළිබඳව

## අධිකරණයට අපහාසයක් වන ප්‍රකාශ

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 105(3) වන ව්‍යවස්ථාවට අනුව අධිකරණයට අපහාස කිරීම වරදක් වේ. එබැවින් අධිකරණයට අපහාසයක් වන ප්‍රකාශ ජනමාධ්‍ය තුළ පළකිරීම වරදක් වේ.

## පාර්ලිමේන්තුවට අපහාසයක් වන පළකිරීම

පාර්ලිමේන්තු බලතල සහ වරප්‍රසාද පනතට අනුව පාර්ලිමේන්තුවට අපහාසයක් වන ප්‍රකාශන, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුගේ ක්‍රියාකළාපය පිළිබඳ අපහාසයක් වන ප්‍රකාශ, කථානායකවරයා විසින් හැන්සාර්ඩ් වාර්තාවෙන් ඉවත් කළ යුතු බවට නියෝග කළ කරුණු,පාර්ලිමේන්තුව තුළ හෝ කමිටු තුළ සිදුවූ කරුණු පිළිබඳව අසත්‍ය වාර්තා පළ කිරීම වරදක් බව දක්වා ඇත,

## බුද්ධිමය දේපළ පනතට පටහැනි වන්නා වූ පළකිරීම්

බුද්ධිමය දේපළ පනතේ 6 වන වගන්තිය යටතේ ආරක්ෂිත කෘති ලෙස සැලකෙන කෘතියක කතුවරයාගෙන් හෝ නිර්මාණ ශිල්පියාගෙන් ලබාගත් නිසි අවසරයකින් තොරව එම කෘතියක් හෝ ඉන් සැලකිය යුතු කොටසක් පළකිරීම ප්‍රකාශන අයිතිය උල්ලංඝනය කිරීමකි.

## නිල රහස් පිළිබඳ පළකිරීම්

රාජ්‍ය නිල රහස් පනතේ 6(1) වගන්තියට අනුව කිසියම් නිල රහස් හෝ රහස් ලේඛනයක් හෝ සතුරකුට සෘජුව හෝ වක්‍රව ප්‍රයෝජනවත් වීමට අදහස් කරන හෝ විය හැකි හෝ ගණනය කර ඇති තොරතුරු.ලබා ගැනීම, එකතු කිරීම, වාර්තා කිරීම, ප්‍රකාශයට පත් කිරීම හෝ භාවිත කිරීම හෝ සන්නිවේදනය කිරීම වරදකි.

## හදිසි නීති රෙගුලාසි කඩ කරන පළ කිරීම්

මහජන ආරක්ෂක ආඥා පනත යටතේ හදිසි අවස්ථාවක් ක්‍රියාත්මක වන අවස්ථාවක පනවන ලද හදිසි අවස්ථා නියෝගවල සඳහන් වන ප්‍රතිපාදන කඩකරන ආකාරයේ ප්‍රකාශන සහ පුවත් ජනමාධ්‍ය තුළ පළ කිරීම වරදකි.

## ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ නියෝග කඩකරන ආකාරයේ පළකිරීම්

ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන ) පනතේ 27 වගන්තිය යටතේ පනවන ලද නියෝග කඩ කරන ආකාරයේ පළ කිරීම් ජනමාධ්‍ය තුළ පළ කිරීම වරදකි. මේ වනවිට පනවා ඇති එවැනි නියෝග

- 2011 අංක 1 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (ද්‍රවිඩ ඊළාම් විමුක්ති කොටි සංවිධානය තහනම් කිරීමේ) නියෝග
- 2011 අගෝස්තු 29 වන දින අංක 1721/2 දරන (අති විශේෂ ගැසට් පත්‍රය )
- 2011 අංක 2 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (දෙමළ පුනරුත්ථාපන සංවිධානය තහනම් කිරීමේ) නියෝග (2011 අගෝස්තු 29 වන දින අංක 1721/2 දරන අති විශේෂ ගැසට් පත්‍රය )
- 2019 අංක 1 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (අන්තවාදී සංවිධාන තහනම් කිරීමේ) නියෝග (2019 මැයි 13 වන දින අංක 2132/3 දරන අති විශේෂ ගැසට් පත්‍රය)
- 2021 අංක 2 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (අන්තවාදී සංවිධාන තහනම් කිරීමේ) නියෝග (2021 අප්‍රේල් 13 වන දින අංක 22223/3 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

මේ අනුව මෙම නියෝග මගින් තහනම් කර ඇති සංවිධාන ප්‍රවර්ධනය වන ආකාරයේ ප්‍රකාශ කිරීම් ජනමාධ්‍ය තුළ පළකිරීම වරදකි.

# සටහන්

# 4.

# මැතිවරණ සමයේදී ජනමාධ්‍ය භාවිතය

මැතිවරණයකදී ජනමාධ්‍යයට හිමිවන භූමිකාව සුවිශාලය. එම නිසාම මැතිවරණ සමයකදී ජනමාධ්‍ය හැසිරීම අපක්ෂපාතී සහ සත්‍යවාදී වීම නිදහස් සහ සාධාරණ මැතිවරණයක් සඳහා අනිවාර්යයෙන්ම අවශ්‍ය වේ. ඒ සඳහාඅවශ්‍යවන සුවිශේෂී නීති රීති මැතිවරණ සමයකදී ජනමාධ්‍ය සම්බන්ධයෙන් ක්‍රියාත්මක වේ.

## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් ප්‍රතිපාදන

මැතිවරණයක් ප්‍රකාශයට පත් කළ දින සිට මැතිවරණයක ප්‍රතිඵළ නිකුත්කර  අවසන් වන දින දක්වා ජනමාධ්‍ය අපක්ෂපාතීව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය මාධ්‍ය උපමාන නිකුත් කිරීම මැතිවරණ කොමිෂන් සභාව විසින් සිදුකළ යුතු බවත් එම මාධ්‍ය උපමානයන්ට අනුකූලව කටයුතු කිරීම සියලුම මාධ්‍ය ආයතන වල වගකීමක්  බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ(5)(ආ)  වන ව්‍යවස්ථාවේ  දැක්වේ.

නමුත් මෙම මාධ්‍ය උපමානවලට අවනත නොවීම සම්බන්ධයෙන් නඩු පැවරිය හැකිවන්නේ රාජ්‍ය මාධ්‍යයන්ට එරෙහිව පමණක් බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104(උ)(උ) ව්‍යවස්ථාව අධ්‍යයනය කිරීමේදී පැහැදිලි වේ.

## මැතිවරණ පනත් තුළ සඳහන් ප්‍රතිපාදන

### පුවත්වල අසත්‍ය වාර්තා පළ කිරීම

මැතිවරණයකදී අපේක්ෂකයකුගේ පිළිගත් දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක කතා හෝ කටයුතු සම්බන්ධයෙන් නැතහොත් එවැනි යම් අපේක්ෂකයකුගේ පිළිගත් දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක මැතිවරණ කටයුතු පවත්වාගෙන යාම පිළිබඳව හෝ සම්බන්ධව යම් අසත්‍ය ප්‍රකාශයක් පුවත්පතක පළකරනු ලැබීම වරදක් බව ජනාධිපතිවරණ පනත, පාර්ලිමේන්තු මැතිවරණ පනත, පළාත් සභා ඡන්ද විමසීම් පනත සහ පළාත් පාලන ඡන්ද විමසීම් පනත යන මැතිවරණ පනත් තුළ ඇතුළත් වේ.

මෙම වරදකට වැරැදිකරුවකු වන අයකුට දඬුවම් ලෙස රුපියල් 300 කට නොවැඩි දඩයකට යටත්විය යුතුය. එසේම එවැනි වරදකරුවකුට වසර 3ක් දක්වා මැතිවරණයකට ඡන්දදායකයකු ලෙස ලියාපදිංචි වීම හෝ ඡන්දයකට ඉදිරිපත්වීමට නොහැකිවන බවද එම පනත් තුළ සඳහන් වේ.

මේ නිසා මැතිවරණ සමයකදී ජනමාධ්‍ය වඩාත් අපක්ෂපාතී ලෙස පවත්වාගෙන යාමට මාධ්‍යවේදීන් වගබලාගත යුතුය.

# 5.

# ජනමාධ්‍ය නියාමන නීති

## මුද්‍රිත මාධ්‍ය නියාමනයට අදාළ නීති

1975 අංක 05 දරන ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනත

1839 අංක 5 දරන ප්‍රවෘත්ති පත්‍ර ආඥා පනත

1885 අංක 1 දරන මුද්‍රණකරුවන් සහ ප්‍රකාශකයන් පිළිබඳව ආඥා පනත

1902 අංක 16 මුද්‍රණාල ආඥා පනත

## පුවත්පත් මණ්ඩල පනත යටතේ පනවා ඇති නියෝග සහ රීති

1981 පුවත්පත් මණ්ඩල (පත්‍රකළාවේදීන් සඳහා ආචාර ධර්ම සංග්‍රහය) රීතී.

1973 ලංකා පුවත්පත් මණ්ඩල (සාමාන්‍ය) නියෝග

1973 ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල (සාමාන්‍ය) නියෝග (1994 සංශෝධනය)

1973 ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල (සාමාන්‍ය) නියෝග (2013 සංශෝධනය)

## විද්‍යුත් මාධ්‍ය නියාමනයට අදාළ නීති රීති

1996 අංක 27 දරන සංශෝධනයෙන් සංශෝධිත 1991 අංක 25 දරණ ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත

1982 අංක 6 ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනත

1966 අංක 37 දරන ගුවන් විදුලි සංස්ථා පනත

## විද්‍යුත් මාධ්‍ය නියාමනයට අදාළ නියෝග

2005 ගුවන්විදුලි විකාශන පිළිබඳ උපදේශක කාරක සභා නියෝග (2006.01.04 දිනැති අංක 1426/16 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

2005 රූපවාහිනී විකාශන පිළිබඳ උපදේශක කාරක සභා නියෝග (2006.01.04 දිනැති අංක 1426/16 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

2010 පෞද්ගලික රූපවාහිනී විකාශන මධ්‍යස්ථාන නියෝග (2010.09.03 දිනැති අංක 1669/25 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

1996 අංක 2 දරන විදුලි සංදේශ (ගුවන්විදුලි තරංග බලපත්‍ර) නියෝග (1996.06.25 දින අති විශේෂ ගැසට් පත්‍රය)

2011 අංක 01 දරන බුද්ධිමය දේපොළ නියෝග (2011.01.05 දිනැති අංක 1687/28 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

2019 අංක 01 දරන බුද්ධිමය දේපොළ නියෝග (ගීත සහ සංගීතමය කෘති) (2019.06.17 දිනැති අංක 2128/6 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

2019 අංක 01 දරන බුද්ධිමය දේපොළ නියෝග (ගීත සහ සංගීතමය කෘති) (2020 සංශෝධනය) (2020.02.28 දිනැති අංක 2164/70 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

# සටහන්

# 6.

# ජනමාධ්‍ය ආචාරධර්ම

ජනමාධ්‍ය භාවිතයේදී පිළිපැදිය යුතු ආචාර ධර්ම පද්ධති කිහිපයක්ම පවතී. මෙම ආචාර ධර්ම පද්ධති පහත පරිදි වර්ගීකරණය කළ හැකිය.

1. රජය විසින් හඳුන්වාදී ඇති ආචාරධර්ම පද්ධති
2. ජනමාධ්‍ය සංවිධාන විසින් හඳුන්වාදී ඇති ආචාරධර්ම පද්ධති
3. මාධ්‍ය ආයතන විසින් සම්පාදනය කර ඇති ආචාරධර්ම පද්ධති

## රජය විසින් හඳුන්වාදී ඇති ආචාර ධර්ම පද්ධති

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනත යටතේ හඳුන්වාදී ඇති ආචාරධර්ම පද්ධතිය 1981 පුවත්පත් මණ්ඩල (පත්‍රකලාවේදීන් සඳහා ආචාර ධර්ම සංග්‍රහය) රීතී නමින් 1981/10/14 දින අංක 162/5 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත්කර ඇත. මෙම ආචාර ධර්ම පද්ධතියට අනුව කටයුතු කිරීම සෑම පුවත්පත් කතුවරයකුගේම, ප්‍රකාශකයකුගේ සහ මාධ්‍යවේදියකුගේ නීතිමය වගකීමකි,

## මෙම ආචාර ධර්ම පද්ධතියේ මූලික අංග වනුයේ

- නිරවද්‍යතාවය
- ප්‍රවෘත්තිය හා තම මතය වෙන්කර දැක්වීම තොරතුරු මූලාශ්‍රයේ අවසරයකින් තොරව හෙළි නොකිරීම
- පුද්ගල කීර්තියට ගරු කිරීම
- අපරාධ වාර්තාකරණයේදි සැලකිලිමත්වීම
- අන්‍යයකුගේ ලිපි තමාගේ ඒවා ලෙස පළ නොකිරීම
- අසභ්‍ය ප්‍රකාශන පළනොකිරීම

## වෘත්තීය ගරුත්වය ආරක්‍ෂා කිරීම

මෙම ආචාර ධර්ම පද්ධතිය කඩකරමින් මාධ්‍යකරණයේ යෙදෙන පුවත්පත් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයට පැමිණිලි කළ හැකි අතර එකී මණ්ඩලය විසින් ඒ පිළිබඳව දෙපාර්ශ්වය කැඳවා විමර්ශනයක් සිදුකර වරදක් සිදුකර තිබේ නම් අදාළ නිවැරැදි කිරීමක් පළ කරන ලෙස අණ කිරීම, දෝෂාරෝපණය කිරීම හෝ අදාළ පාර්ශවයෙන් සභා අයදින ලෙස අණ කිරීමට පුවත්පත් මණ්ඩලයට බලය ඇත .

මෙම අචාර ධර්ම පද්ධතිය පුවත්පත් සඳහා පමණක් අදාළ වන අතර ඒ සඳහා අනුකූලව කටයුතු කිරීමේ නීතිමය වගකීමක් පවතී.

## ජනමාධ්‍ය සංවිධාන විසින් හඳුන්වාදී ඇති ආචාරධර්ම පද්ධති

### 1. ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම පිළිගත් මාධ්‍ය ප්‍රතිපත්ති මාලාව

ශ්‍රි ලංකාවේ ජනමාධ්‍ය සංවිධාන, කතෘ සංසදය, සහ ප්‍රධාන පුවත්පත් ආයතන විසින් පිළිගනු ලැබූ ආචාරධර්ම පද්ධතියක් ක්‍රියාත්මක වන අතර එය "ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම පිළිගත් මාධ්‍ය ප්‍රතිපත්ති මාලාව" ලෙස හඳුන්වනු ලැබේ, එම අචාර ධර්ම පද්ධතියේ මූලික අංග වනුයේ

- නිරවද්‍ය වාර්තාකරණය
- නිවැරැදිකිරීම් හා සමා අයදීම්
- පිළිතුරු දීමට අවස්ථා
- පොදු වාර්තාකරණය හා ලිවීම
- පෞද්ගලිකත්වය
- හිරිහැර හා කපටිකම් නොකිරීම
- ගෞරවය

මෙම ආචාරධර්ම සඳහා පුවත්පත්වලට පවතින්නේ ස්වේච්ඡා බැඳීමකි. මෙම ආචාරධර්ම පද්ධතියට එකඟවූ පුවත්පත් ආයතනයක පුවත්පතක් විසින් ආචාරධර්ම කඩකරමින් සිදුකරන පළ කිරීමක් සම්බන්ධයෙන් එම පුවත්පතට එරෙහිව ශ්‍රි ලංකා පුවත්පත් පැමිණිලි කොම්ෂම වෙත පැමිණිලි කළ හැකිය. මෙම ආචාරධර්ම පුවත්පත් සහ එම පුවත්පත්වලට අදාළ වෙබ් අඩවි සඳහා අදාල වේ.

## 2. වෙබ් ආචාරධර්ම සංග්‍රහය

වෘත්තීය වෙබ් මාධ්‍යවේදීන්ගේ සංගමය විසින් හඳුන්වා දී ඇති මෙම ආචාරධර්ම පද්ධතිය මාර්ගගතව සිදුකරනු ලබන ප්‍රකාශනයන් සඳහා අදාල වේ. එම ආචාරධර්ම පද්ධතියේ මූලික අංග වනුයේ

- වගකීම්
- ප්‍රවෘත්ති සහ තොරතුරු එක්රැස්කිරීම
- දෝෂ, අඩුපාඩු සහ නිවැරැදිකිරීම්
- මූලාශ්‍රයන්හි විශ්වසනීයත්වය
- වාර්තාකරණයෙහි සමාජ වගවීම්
- පුද්ගල සහ පෞද්ගලික රහස්‍යත්වය
- වෙබ් මාධ්‍ය ආශ්‍රිත පුද්ගලයන්ගේ චර්යාව
- මහජන අභිලාෂයන් ආරක්ෂාකර පවත්වාගෙන යාම

## මාධ්‍ය ආයතන විසින් හඳුන්වාදී ඇති ආචාරධර්ම පද්ධති

- වෙළෙඳ සේවයේ ව්‍යාපාර මෙහෙයුම් නීති රීති සංග්‍රහය 1994 ( ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව)
- ප්‍රවෘත්ති මාර්ග දර්ශක (ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ප්‍රවෘත්ති ප්‍රකාශ සඳහා මග පෙන්වන මූලධර්ම)
- උප්‍රව ප්‍රජා ගුවන් විදුලියේ සන්නිවේදකයන් සඳහා මාර්ගදර්ශක
- ටෙලිවිෂන් විකාශනයේ සහ ටෙලිවිෂන් වෙළෙඳ දැන්වීම්කරණයේ ආචාරධර්ම, ප්‍රමිතීන් සහ පරිචයන් (ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව)
- වෙළෙඳ දැන්වීම් විකාශනය පිළිබඳ ප්‍රමිතීන් හා පරිචයන් සංග්‍රහය (ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව
- ටෙලිනාට්‍ය සහ සංගීත වැඩසටහන් පිළිබඳ ප්‍රතිපත්ති මාලාව (ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව)
- කර්තෘ මණ්ඩල ආචාරධර්ම රාවය
- නෙත් FM ආචාරධර්ම පද්ධතිය
- groundiviews වෙබ් අඩවියේ ආචාරධර්ම පද්ධතිය

# සටහන්

# 7.

# සිවිල් අපහාසය

ප්‍රජනමාධ්‍ය තුළ සිදුකරන ඇතැම් පළකිරීම් මගින් යම් පුද්ගලයකුගේ කීර්තිනාමයට හානියක් සිදුවුවහොත් ඒ සම්බන්ධයෙන් අපහාස නඩු පැවරීමේ අයිතිය එම පුද්ගලයාට පවතී. එබැවින් මාධ්‍යවේදීන් විසින් සිවිල් අපහාසය පිළිබඳ නීති තත්ත්වය පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

පුද්ගලයකු සතු කීර්තිය ආරක්ෂා කිරීම හා තවත් පුද්ගලයකු සතු කතා කිරීමේ හා අදහස් පළකිරීමේ අයිතිය යන එකිනෙකට ගැටෙන සංකල්ප 2ක් අතර තුලනයක් ඇති කිරීම සිවිල් අපහාස නීතිය මගින් සිදු වේ.

අපහාස නඩුවකදී පැමිණිලිකරු විසින් කරුණු 3ක් ඔප්පුකළ යුතු බව ඉංග්‍රීසි නීතියේ දැක්වේ. එනම්

1. එම ප්‍රකාශය අපහාසාත්මක බව
2. අදාළ ප්‍රකාශය පැමිණිලිකරු කෙරෙහි අදාළ බව.
3. ප්‍ර,කාශයට ප්‍රසිද්ධියක් ලැබී ඇති බව.

අපහාස නඩුවකදී විත්තිවාචක ලෙස විත්ති පාර්ශ්වයට ඉදිරිපත් කළ හැකි කරුණු 2ක්ද ඉංග්‍රීසි නීතියේ දැක්වේ. එනම්

1. අනුමැතිය
2. යුක්ති සහගත බව

එසේම පාර්ලිමේන්තුවේ සිදුකරන ප්‍රකාශ හෝ අධිකරණයේ ප්‍රකාශ කරන කරුණු එලෙසම ජනමාධ්‍ය තුළ පළකිරීම මගින් සිවිල් අපහාස නඩු උද්ගත නොවන අතර ඒවා ව්‍යතිරේක අවස්ථාවන් වේ.

# 8.

# සමාජ මාධ්‍ය ප්‍රකාශයන්ට අදාළ විශේෂ නීති

සමාජ මාධ්‍ය යනු කිසිදු නීතියකට යටත් නොවන මාධ්‍යයක් නොවන බව පළමුව වටහාගත යුතුය.

එයද අදහස් ප්‍රකාශනයේ අයිතියේ එක් මාදිලියක් වන අතර එයට අදාළ ආවේණික සීමාවන් මෙන්ම නීතිරීති සමාජ මාධ්‍ය කෙරෙහිද බලපානු ලබයි. විශේෂයෙන්ම අන්තර් ජාලය තුළ කෙරෙන එක් සන්නිවේදනයකදී බොහෝ විට එකිනෙකට වෙනස් නීති පද්ධති පවතින ස්වාධීන රටවල් 3ක නීති පද්ධති 3ක බලපෑමට යටත්වේ. එනම්

1. අන්තර්ජාලයෙන් තොරතුරු ලබාගන්නා පුද්ගලයා පදිංචි රටේ නීති පද්ධතිය.
2. අදාළ වෙබ් අඩවියේ දත්ත සමුදාය (server) පවතින රටේ නීති පද්ධතිය.
3. අන්තර්ජාලය වෙත තොරතුරු මුදාහරින පුද්ගලයා පදිංචි රටේ නීති පද්ධතිය.

සමාජ මාධ්‍ය භාවිත කරන්නන්ට එරෙහිව බහුලව නීතිය ක්‍රියාත්මක වන අවස්ථා කිහිපයක් පහත පරිදි සංක්ෂිප්ත කළ හැකිය.

## 2006 අංක 19 දරණ
## ඉලෙක්ට්‍රොනික් ගණුදෙනු පනත

"ඉලෙක්ට්‍රොනිකව තිබීමේ හේතුව මත කිසිම දත්ත පණිවිඩයක්,ඉලෙක්ට්‍රොනික ලේඛනයක්, ඉලෙක්ට්‍රොනික වාර්තාවක් හෝ වෙනත් සන්නිවේදනයක් පිළිබඳ පිළිගැනීම , එහි බලපෑම, වලංගුභාවය, හෝ එය බලාත්මක කිරීමේ හැකියාව අහිමි නොකළ යුතුය." යනුවෙන් පනතේ 3වන වගන්තියේ දැක්වේ.

මේ අනුව සමාජ මාධ්‍යයක පළවන ලිපියක් හෝ වාර්තාවක් මුද්‍රිත පුවත්පතක පළවූවක් සේ නීතිය ඉදිරියේ බලාත්මක වේ. එබැවින් සමාජ මාධ්‍ය ප්‍රකාශනද, සිවිල් අපහාස නීතිය, පාර්ලිමේන්තු වරප්‍රසාද, අධිකරණයට අපහාස කිරීම,අසභ්‍ය ප්‍රකාශන පිළිබඳ නීතිය වැනි සීමාවන්ට යටත්ව සිදුකළ යුතුවේ.

## 2007 අංක 24 දරන පරිගනක අපරාධ පනත

සමාජ මාධ්‍ය භාවිතාව සඳහා පරිගණක භාවිත කරනු ලැබේ. පරිගණක අපරාධ පනතේ 6 වන වග්නිතිය දක්වන්නේ "පරිගණකයක් යොදා ගනිමින් ජාතික ආරක්ෂාවට, ජාතික ආර්ථිකයට, මහජන ආරක්ෂාවට හානිවිය හැකි යමක් සිදු කිරීම. වරදක් වන බවයි. එබැවින් සමාජ මාධ්‍ය භාවිත කරන අවස්ථාවලදී මේ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

## 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත

බුද්ධිමය දේපළ පනත යටතේ 6 වන වගන්තිය සලකා බැලීමේදී අන්තර් ජාලයේ ප්‍රකාශනද ආරක්ෂිත කෘතියක් ලෙස සැලකිය හැකිය. එමෙන්ම පළකිරීම යන්නට " ඉලෙක්ට්‍රොනික මාධ්‍යයක් මගින් මහජනයා වෙත සපයා තිබෙන අවස්ථාවක" යන්නද ඇතුළත්වන හෙයින් පනතේ කාර්යන් සඳහා පළකිරීම යන්නට අන්තර් ජාලයේ පළකිරීමද ඇතුළත් වේ.

මෙම ප්‍රතිපාදන අනුව අන්තර් ජාල ප්‍රකාශන සඳහා එහි මුල් හිමිකරුවන්ට ප්‍රකාශන හිමිකම ලැබේ.

එමෙන්ම "පරිගණක වැඩසටහන් ද පනත යටතේ ආරක්ෂිත කෘති ලෙස හඳුනාගෙන තිබේ. මේ නිසා ආරක්ෂිතයක් සමාජ මාධ්‍ය තුළ පළ කරන්නේ නම් එහි කතුවරයාගෙන් අවසරය ලබාගත යුතුය.

# සටහන්

# 9.

# ජනමාධ්‍යවේදීන් මුහුණ දෙන නීතිමය අභියෝග

## සිවිල් අපහාස චෝදනා

මාධ්‍යයක පළ කරන පළකිරීමක් මගින් යම් පුද්ගලයකුගේ කීර්ති නාමයට හානි සිදුවීමක් සිදුවන බවට චෝදනා නගමින් වන්දි ඉල්ලා නඩු පවරන බවට නීතිඥයන් මගින් එන්තරවාසි එවීමට සහ සිවිල් අධිකරණවල වන්දි ඉල්ලා නඩු පැවරීමේ අවදානමට මාධ්‍යවේදීන් ලක්වේ. විශ්වසනීය මූලාශ්‍ර මගින් තොරතුරු ලබාගැනීම, කරුණු තහවුරු කරගැනීම, සත්‍යාපනය මෙන්ම අපහාසාත්මක අසත්‍ය විවේචනයන්ගෙන් වැළකීම මගින් මෙම තර්ජන සීමාකරගත හැකිය.

## පාර්ලිමේන්තු වරප්‍රසාද කඩ කිරීමේ චෝදනා

මාධ්‍ය ඔස්සේ සිදුකරන ප්‍රකාශයන් මගින් පාර්ලිමේන්තු වරප්‍රසාද කඩවීමක් සිදුවූ බවට චෝදනා නගමින් පාර්ලිමේන්තුවේ වරප්‍රසාද කමිටුව ඉදිරියට කැඳවීමට මෙන්ම ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ නඩු පැවරීමේ අවදානමක්ද පවතී.

පාර්ලිමේන්තුවේ සහ පාර්ලිමේන්තු කමිටුවල සිදුවූ සත්‍ය සිදුවීම් පමණක් වාර්තා කිරීම, හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කළ යුතු යැයි කථානායකවරයා නියම කළ කොටස් මාධ්‍යයේ පළ නොකිරීම ආදිය මගින් මෙම අභියෝගය ජයගත හැකිය,

## සාපරාධි අපහාස චෝදනා

දණ්ඩ නීති සංග්‍රහය යටතේ වරදක් ලෙස පැවති අපකීර්තිකරණය හෙවත් සාපරාධි අපහාසය යන වරද 2002 අංක 12 දරන දණ්ඩ නීති සංග්‍රහ (සංශෝධන) පනත මගින් ඉවත් කර ඇත. නමුත් ඇතැම් පුද්ගලයන් මේ පිළිබඳව පොලිසියට සිදුකරන පැමිණිලි අනුව ඇතැම් පොලිස් නිලධාරීන් විසින් මාධ්‍යවේදීන්ව මෙම චෝදනාව මත පොලිසියට කැඳවන අවස්ථා වාර්තා වී ඇත. එවැනි අවස්ථාවලදී මෙම නීතිය අහෝසි වී ඇති බව පොලිස් නිලධාරීන්ට පෙන්වාදීම මගින් චෝදනාවන්ගෙන් නිදහස් විය හැකිය.

## ප්‍රකාශන අයිතිය කඩ කිරීම පිළිබඳ චෝදනා

වෙනත් පුද්ගලයන්ගේ ලිපි කොටස් හෝ ඡායාරූප වීඩියෝ දර්ශන නිසි අවසරයකින් තොරව තම මාධ්‍ය සඳහා භාවිතා කිරීම මගින් එකී කෘතීන්වල මුල් හිමිකරුවන් විසින් බුද්ධිමය දේපළ පනත යටතේ වන්දි ඉල්ලා නඩු පැවරීමේ අවදානම පවතී. කෘතියේ මුල් හිමිකරුගේ ලිඛිත අවසරය ලබාගෙන එය තම මාධ්‍ය ඔස්සේ පළ කිරීම මගින් මෙම අවදානමින් ජයගත හැකිය.

## සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පනත යටතේ නඩු පැවරීම

ජාතීන් අතර වෛරය පැතිරවීමේ හෝ යුද්ධය පැතිරවීමට තුඩුදෙන වාර්තා මාධ්‍ය තුළ පළකිරීම මගින් 2017 අංක 57 දරණ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් සම්මුතිය පනත යටතේ නඩු පැවරීමේ අවදානය පවතී. එබැවින් වාර්ගික හෝ ආගමික වෛරය පතුරවන ප්‍රකාශ මාධ්‍ය තුළ පළ නොකිරීමට මාධ්‍යවේදීන් වග බලා ගත යුතුය.

## ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සහ නියෝග යටතේ සීමාවන්

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ 2(අ))උ) වගන්තිය දක්වන්නේ විවිධ ජන කොටස් අතර හෝ වාර්ගික හෝ ආගමික කණ්ඩායම් අතර සාහසික ක්‍රියා හෝ බෙදීම් ඇතිවන ආකාරයේ ප්‍රකාශයන් පළ කිරීම වරදක් බවයි. එබැවින් එවැනි ආකාරයේ පළ කිරීම් සිදු නොකිරීමට වග බලා ගත යුතුය. එසේම ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ 27 වගන්තිය යටතේ නිකුත් කර ඇති නියෝගයන්ට පටහැනි ලෙස මාධ්‍ය වාර්තා පළ කිරීමටද වග බලා ගත යුතුය.

## හදිසි නීති රෙගුලාසි යටතේ සීමාවන්

මහජන ආරක්ෂක ආඥා පනත යටතේ ජනාධිපති විසින් හදිසි අවස්ථාවක් ප්‍රකාශයට පත් කර ඇති අවස්ථාවක සාමාන්‍ය නීති අභිභවා හදිසි අවස්ථා නියෝග බලාත්මක වේ.

එබැවින් එම තත්කාලීන හදිසි අවස්ථා නියෝගයන් පිළිබඳව දැනුවත් වීම සහ එකී නියෝගයන්හි දක්වන සීමාවන් පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

## දණ්ඩ නීති සංග්‍රහය පනත යටතේ නඩු පැවරීම

මාධ්‍ය මගින් සිදුකරනු ලබන ඇතැම් පළ කිරීම් සම්බන්ධයෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 120, 286, 286අ, 291අ, 291ආ, 345, 256ඇ, 402, 486 යන වගන්ති උල්ලංඝනය කළ බවට චෝදනා එල්ල වීමේ අවදානමක් පවතින බැවින් එම වගන්ති පිළිබඳව අවබෝධයක් ලබාගෙන එම වගන්ති උල්ලංඝනය නොවන ආකාරයෙන් කටයුතු කිරීම ආරක්ෂාකාරී වේ,

## සාක්ෂිකරුවන් ලෙස කැඳවීම්

මාධ්‍යවේදියකු මාධ්‍ය තුළ පළකරන ප්‍රකාශයක් මගින් අපරාධ වරදක් හෙලිදරව් වන්නේ නම් එවැනි අවස්ථාවකදී එම වරද පිළිබඳව විමර්ශණය කරනු ලබන පොලිස් නිලධාරීන් විසින් මාධ්‍යවේදියාව පොලිස් විමර්ශන සඳහා තොරතුරු ලබාගැනීමත් එම චෝදනාව සම්බන්ධයෙන් නඩු පැවරීමක් සිදුවන අවස්ථාවකදී එකී නඩුවේ පැමිණිල්ලේ සාක්ෂිකරුවකු ලෙස කැඳවීමටත් අවස්ථාව පවතී. එවැනි අවස්ථාවකදී පොලිසියට සහ අධිකරණයට සහය ලබාදීමට මාධ්‍යවේදියකු නීතියෙන් බැඳේ.

## නියාමන නීති යටතේ නීති කෘත්‍යයන්

ජනමාධ්‍ය මගින් පළකරන ඇතැම් ප්‍රකාශන වෘත්තීය ආචාරධර්ම කඩ කිරීම් හෝ විද්‍යුත් විකාශන මාධ්‍යවල බලපත්‍ර කොන්දේසි කඩ කිරීමක් සිදුවන්නේ නම් අදාළ නියාමන ආයතනය මගින් සිදුකරනු ලබන විමර්ශනයන් සඳහා කැඳවනු ලැබීමට ඉඩකඩ තිබේ එබැවින් වෘත්තීය ආචාරධර්ම පිළිබඳව සැලකිලිමත්ව මාධ්‍ය තුළ පළ කිරීම් සිදුකළ යුතුය.

## පරිගණක අපරාධ පනත යටතේ නඩු පැවරීම

පරිගණක අපරාධ පනතේ 6 වන වගන්තිය යටතේ දැක්වෙන්නේ පරිගණකයක් යොදා ගනිමින් ජාතික ආරක්ෂාවට ,ජාතික ආර්ථිකයට , මහජන ආරක්ෂාවට හානිවිය හැකි යමක් සිදු කිරීම වරදක් බවයි. මාධ්‍යවේදීන්ව සහ මාධ්‍ය ක්‍රියාකාරීන් මෙන්ම පරිගණක හා ජංගම උපකරණ මෙම වගන්තිය භාවිත කරමින් අත් අඩංගුවට පත්වී ඇත.

මෙවැනි වැරදි පිළිබඳ විමර්ශනය කිරීමට පොලිසියට සහාය වීම සඳහා අධිකරණ අමාත්‍යවරයා විසින් විශේෂඥයන් පත්කරනු ලැබේ. ඒ හැරුණ විට මේ පිළිබඳව විමර්ශනය කිරීමේ දී පරිගණකයක් පරීක්ෂා කළ හැක්කේ පොලිස්පතිවරයාගෙන් ඒ පිළිබඳ සහතිකයක් ලද පොලිස් නිලධාරියකුට පමණි.

# සටහන්

# 10.

# ගැටුම් වාර්තාකරණයට අදාළ සුවිශේෂී අභියෝග

මාධ්‍යවේදියකු විසින් ක්ෂේත්‍රයේ සිදුකරනු ලබන තොරතුරු එකතු කිරීම සහ වාර්තාකරණය අභියෝගාත්මක කාර්යයක් වන අතර ගැටුම්කාරී වාතාවරණයක ක්ෂේත්‍රයේ රැඳී සිටිමින් වාර්තාකරණය වඩාත් නීතිමය අභියෝගයන්ට මුහුණ දෙන අවස්ථාවකි. එකී අභියෝගයන් කිහිපයක් හදුනාගැනීමට උත්සාහ කරමු.

## අපහාස නඩු පැවරීමේ අභියෝගය

ගැටුම්කාරී වාතාවරණයක් වාර්තාකරණයේදී විශේෂයෙන්ම ගැටුම්කාරී ක්ෂේත්‍රයක් තුළ රැඳෙමින් සජීවී වාර්තාකරණයක යෙදීමේදී සිදුකරන ප්‍රකාශ මගින් පුද්ගලයන්ගේ කීර්තිනාමයන්ට හානි සිදුවීම මගින් සිවිල් අපහාස නඩු පැවරීමේ අවදානමක් පවතී. එම නිසා එකී වාර්තාකරණයන්හිදී ජනප්‍රිය පුද්ගලයන් සම්බන්ධ කරුණු ඉදිරිපත් කිරීමේදී කරුණුවල නිවරද්‍යභාවය පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

## අපරාධ චෝදනා එල්ලවීමේ අභියෝගය

ගැටුම්කාරී කණ්ඩායම්වල සාමාජිකයන් ලෙසින් ගැටුම් වාර්තා කිරීමට සම්බන්ධ වන මාධ්‍යවේදීන්ටද අපරාධ චෝදනා එල්ල වීමේ අවදානමක් ඇති බැවින් ගැටුම්කාරී කණ්ඩායම්වලින් වෙන්ව අනන්‍යතාවක් ගොඩනගා ගනිමින් වාර්තාකරණය ඉටුකිරීම ඉතා වැදගත් වේ.

## සාක්ෂිකරුවකු ලෙස කැඳවීමේ අභියෝගය

ගැටුම්කාරී වාතාවරණයක සිදුවන යම් අපරාධමය සිදුවීම් සම්බන්ධයෙන් එකී ක්‍රියාවන් සමීපව නිරීක්ෂණය කළ සහ වාර්තාකළ පුද්ගලයන් වශයෙන් මාධ්‍යවේදීන්ව එම අපරාධ පරීක්ෂණ කටයුතුවලදී පොලිසියේ මෙන්ම අධිකරණය ඉදිරියේ සාක්ෂි ලබාදීම සඳහා කැඳවීමේ අවස්ථාවන් උදාවිය හැකිය.

## කැමරා උපකරණ පොලිස් භාරයට ගැනීමේ අභියෝගය

ගැටුම්කාරී තත්ත්වයන් තුළ සිදුවන යම් යම් සිදුවීම් පිළිබඳව විමර්ශන කටයුතු සඳහා මාධ්‍යවේදීන්ගේ කැමරා උපකරණ තුළ ඇති දත්ත ලබාගැනීම සඳහා එකී උපකරණ නඩු භාණ්ඩ ලෙස පොලිසිය සහ අධිකරණ භාරයට පත් වීමේ සීමිත වුවද අවස්ථාවන් පවතී.

## අත්අඩංගුවට පත්වීමේ අභියෝගය

වාර්තාකරු ගැටුම්කාරී පාර්ශ්වයක් ලෙස හඳුනාගනිමින් අත්අඩංගුවට පත්වීමට මෙන්ම ආරක්ෂක අංශවල අණ නොතැකීම මත අත්අඩංගුවට පත්වීමේ අවදානමක්ද පවතී.

# 11.

# අත්අඩංගුවට ගැනීම පිළිබඳ නීති තත්ත්වය

## වරද කියාදී අත්අඩංගුවට ගැනීම

නීතියෙන් නියම කරනු ලැබූ කාර්යපටිපාටියට අනුකූලව මිස කිසිම තැනැත්තකු සිරභාරයට ගැනීම නොකළ යුත්තේ ය. යම් තැනැත්තකු සිරභාරයට ගනු ලබන්නේ යම් හේතුවක් මත ද ඒ හේතුව ඒ තැනැත්තාට දැන්විය යුතු බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(1) දක්වා ඇත. ඒ අනුව යම් පුද්ගලයකු වරෙන්තුවක් නොමැතිව අත් අඩංගුවට ගත හැකිවන්නේ සංඥෙය වරදක් (වරෙන්තුවක් නොමැතිව අත්අඩංගුවට ගත හැකි වරදක්) සම්බන්ධයෙන් සාධාරණ සැකයක්. විශ්වාස කටයුතු තොරතුරක් හෝ සාධාරණ පැමිණිල්ලක් මතය. එම වරද අත්අඩංගුවට ගන්නා මොහොතේ පැහැදිලි කර දිය යුතුය.

එසේ අත්අඩංගුවට ගැනීමේදී අවනත කර ගැනීමට අවශ්‍ය අවම බලය භාවිත කිරීම හැර අත් අඩංගුවට ගන්නා තැනැත්තාට පහර දීමට අයිතියක් පොලිසියට (හෝ අත්අඩංගුවට ගන්නා බලධාරීන්ට) නොමැත.

## රඳවාගැනීම සහ ප්‍රශ්න කිරීම

සාමාන්‍ය නීතිය යටතේ අත්අඩංගුවට ගැනීමක් සිදුකළ පුද්ගලයකු අපරාධයක් සම්බන්ධව ප්‍රශ්න කිරීමේ බලය පොලිසියට ඇත. එසේ ප්‍රශ්න කිරීමේදී කිසිදු ආකාරයක පහරදීමක් හෝ අවමන් සහගත සැලකිමකට ලක් කිරීමට පොලිසියට බලයක් නොමැත. අත්අඩංගුවට පත් පුද්ගලයකු මහෙස්ත්‍රාත්වරයකුට ඉදිරිපත් නොකර තබා ගත හැකි උපරිම කාලය වන්නේ පැය 24කි. එම කාලය තුළ අත්අඩංගුවට ගත් පුද්ගලයාව

- නිදහස් කිරීම
- ඇප ලබාදීම
- මහේස්ත්‍රාත්වරයකු වෙත ඉදිරිපත් කිරීම සිදුකළ යුතුය.

අත්අඩංගුවට ගන්නා ලද පුද්ගලයා මහේස්ත්‍රාත්වරයකු වෙත ඉදිරිපත් කළ විට පොලිසිය විසින් ලබාදෙන විමර්ශන වාර්තාවට අනුව

- ඇප ලබාදීමට
- රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට හෝ
- රැඳවුම් නියෝගයක් නිකුත් කිරීමේ බලය අවස්ථානුකූලව මහේස්ත්‍රාත්වරයා සතුව පවතී.

## ප්‍රකාශයක් ලබාදීමට පොලිසියට කැඳවීම

යම් අපරාධ වරදක් අනාවරණය කර ගැනීම සඳහා මාධ්‍යවේදීයකුගෙන් ප්‍රකාශයක් ලබාගැනීම සඳහා පොලිස් නිලධාරියකුට එම මාධ්‍යවේදියාව පොලිස් ස්ථානයට කැදවීමේ ප්‍රතිපාදන අපරාධ නඩු විධාන සංග්‍රහය තුළ අන්තර්ගතව ඇත.

".......එම කාරණය සම්බන්ධයෙන් අවස්ථානුගත කරුණු දන්නා බව ලැබුණ තොරතුරු අනුව හෝ අන්‍යාකාරයකින් පෙනී යන්නා වූ ද යම් තැනැත්තකුට තමා ඉදිරියට පැමිණෙන ලෙස ලියවිල්ලකින් වූ නියකමයක් මගින් නියම කරනු ලැබිය හැකි අතර එසේ නියම කරන ලද පරිදී ඒ තැනැත්තා පැමිණිය යුතුය." යනුවෙන් අපරාධ නඩු විධාන සංග්‍රහයේ 109 (6) වගන්තියේ සඳහන් වේ. ඒ අනුව පොලිස් ස්ථානයක් මගින් හෝ පොලිසියේ යම් ඒකකයක් මගින් එවැනි කැඳවීමක් සඳහා අවනත වීමේ වගකීම සෑම මාධ්‍යවේදියකුගේම නීතිමය වගකීමකි.

නමුත් එවැනි කැඳවීමක් දුරකථනයෙන් හෝ ලිඛිතව ලැබුණ පසුව අදාළ වගකිව යුතු නිලධාරියාගෙන් තමාගේ ලබාගැනීමට යන ප්‍රකාශයට අදාළ වරද කුමක්ද යන්න පිළිබඳව විස්තරයක් ලබාගැනීමට මාධ්‍යවේදියා කටයුතු කළ යුතුය. එසේම එහිදී නීතිඥයකු ගේ සේවය ලබාගැනීමට ද අයිතියක් ඇත.

පොලිස් නිලධාරියකු විසින් සිදුකරන ප්‍රශ්න කිරීමකදී උත්තර දීම ප්‍රතික්ෂේප කිරීම වරදක් බව දණ්ඩ නීති සංග්‍රහයේ 177 වගන්තියේ දැක්වේ,

එසේම එවැනි ප්‍රශ්න කිරීමකදී අසත්‍ය ප්‍රකාශ කිරීම ද වරදක් බව දණ්ඩ නීති සංග්‍රහයේ 179 වගන්තියේ දැක්වේ.

නමුත් ප්‍රකාශයක් සටහන් කිරීමේදි හෝ ප්‍රශ්න කිරීමේදී පහරදීමට කිසිදු අයිතියක් පොලිස් නිලධාරීන්ට නොමැත.

## අත්අඩංගුවේ පසුවන අයකුගේ අයිතිවාසිකම්

- වධහිංසාවෙන් හා අවමන් සහගත සැලකීමෙන් නිදහස
- වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීමේ අයිතිය
- ආහාරපාන ලබාගැනීමේ අයිතිය
- ඥාතීන් සමග කතා කිරීමේ සහ හමුවීමේ අයිතිය
- නීතිඥයකුගේ සේවය ලබාගැනීමේ අයිතිය

## නීතිඥ සහාය ලබාගැනීමේ අයිතිය

සෑම පුරවැසියකුටම සාධාරණ නඩු විභාගයකට ඇති අයිතිය මූලික අයිතිවාසිකමකි. එසේම 2012 මැයි 18 වන දින අංක 1758/36 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කර ඇති 2012 (පොලිස් ස්ථානවලදී නීතිඥයන් පෙනී සිටීමේ)

ඊට මගින් නීතිඥයකුට තම සේවාදායකයකු වෙනුවෙන් පොලිස් ස්ථානයක දී පෙනී සිටීමේ අයිතිය ලබාදී ඇත. ඒ අනුව තම සේවාදායක වෙනුවෙන් පොලිස් ස්ථානයකට පැමිණෙන නීතිඥයකුට අවශ්‍ය පහසුකම් සැලසීමට පොලිස් නිලධාරීන් බැඳී ඇත.

## මහේස්ත්‍රාත්වරයකුට ඉදිරිපත් කිරීමේදී

තමන්ට පොලිස් ස්ථානයේදි සිදුවූ අසාධාරණකම් පිළිබඳව මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියට පමුණුවන අවස්ථාවේදී පැමිණිලි කිරිමේ අයිතිය ඇත. එසේ වෛද්‍ය ප්‍රතිකාර හෝ අධිකරණ වෛද්‍ය පරීක්‍ෂණ ඉල්ලා සිටීමේ අයිතියද පවතී. රක්‍ෂිත බන්ධනාගාරයකදී හෝ පොලිස් ස්ථානයකදී තමන්ට ජීවිත තර්ජනයක් පවතී නම් ඒ පිළිබඳව මහෙස්ත්‍රාත්වරයා පැමිණිලි කිරීමේ අයිතිය පවතී.

## සටහන්

# 12.

# මාධ්‍ය නිදහස අහිමිවීමකදී ගත හැකි නීතිමය පියවර

## මූලික අයිතිවාසිකම් නඩු පැවරීම්

මාධ්‍ය නිදහස කඩවීමේ ක්‍රියාවලිය තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ විස්තර කර තිබෙන මූලික අයිතිවාසිකමක් යම් විධායක හෝ පරිපාලන ක්‍රියාවක් මගින් උල්ලංඝණය වී තිබේ නම් එවැනි අවස්ථාවකදී ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කළ හැකිය.

## ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට පැමිණිලි කිරීම

මාධ්‍ය නිදහස කඩවීමේ ක්‍රියාවලිය තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ විස්තර කර තිබෙන මූලික අයිතිවාසිකමක් යම් විධායක හෝ පරිපාලන ක්‍රියාවක් මගින් උල්ලංඝනය වී තිබේ නම් එවැනි අවස්ථාවකදී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ගොනු කළ හැකිය.

## පොලිසියට පැමිණිලි කිරීම

සිදුවූ මාධ්‍ය නිදහස කඩවීම මගින් අපරාධ වරදක් සංයුක්ත වන්නේ නම් එම සිදුවීම සිදුවූ ප්‍රදේශයට

අදාළ පොලිස් ස්ථානයේ පැමිණිල්ලක් ගොනු කළ හැකිය. පොලිස් ස්ථානයට යාමේ යම් බාධාවක් පවතී නම් 119 දුරකථන අංකය ඔස්සේ හෝ පොලිස් වෙබ් අඩවියට පිවිස මාර්ගගතව පැමිණිල්ලක් සිදුකළ හැකිය.

## ජාතික පොලිස් කොමිෂන් සභාවට පැමිණිලි කිරීම

මාධ්‍ය නිදහස කඩවීම සිදුවූයේ ශ්‍රී ලංකා පොලිසියේ හෝ පොලිස් නිලධාරීන්ගේ ක්‍රියාවක් මගින් නම් එවැනි අවස්ථාවකදී ඒ පිළිබඳව ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් සිදුකළ හැකිය.

## සිවිල් නඩු පැවරීම

මාධ්‍ය නිදහස කඩවීමේ  සිදුවීමට අදාළ කරුණ මගින් මූල්‍යමය හානියක් සිදුවී තිබේනම් වන්දි ඉල්ලා දිසා අධිකරණයක සිවිල් නඩුවක් පැවරීමේ හැකියාව ඇත.

## පුද්ගලික පැමිණිලි ගොනු කිරීම

මාධ්‍ය නිදහස කඩවීමට අදාළ අපරාධ වරදක් සම්බන්ධයෙන් පොලිසියට විධිමත්ව පැමිණිල්ලක් සිදුකර තිබියදී පොලිසිය විසින් නඩු පැවරීමක් සිදු නොකරන්නේ නම් පුද්ගලික පැමිණිල්ලක් මහේස්ත්‍රාත් අධිකරණයට ගොනු කළ හැකිය.

## ඉහල නිලධාරීන්ට පැමිණිලි කිරීම

මාධ්‍ය නිදහස කඩකිරීමට අදාළ සිදුවීම සිදුකරන ලද්දේ රාජ්‍ය නිලධාරීන් විසින් නම් එම නිලධාරියාගේ ඉහළ නිලධාරීන් වෙත ඒ පිළිබඳව පැමිණිලි කළ හැකිය.

# 13.

## සහන ලබාගත හැකි ආයතන

**ගරු අගවිනිසුරුතුමා**
ශ්‍රේෂ්ඨාධිකරණය
ශ්‍රේෂ්ඨාධිකරණ සංකීර්ණය
අලුත්කඩේ මාවත, කොළඹ-12

විමර්ශන අධ්‍යක්ෂ
**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**
අංක 14- ආර්.ඒ.ද මැල් මාවත, කොළඹ-04
හදිසි ඇමතුම-1996

**ජාතික පොලිස් කොමිෂන් සභාව**
අංක 9 ගොඩනැගිල්ල,
B.M.I.C.H පරිශ්‍රය,බෞද්ධාලෝක මාවත,කොළඹ-07
ක්ෂණික ඇමතුම-0710361010
ෆැක්ස්-0112683307
ඊමේල්-info@npc.gov.lk

**පොලිස්පති**
පොලිස් මූලස්ථානය
කොළඹ-01

# සටහන්

# 14.

# අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය සඳහා වූ එක්සත් ජාතීන්ගේ ආයතන

## එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සලය

මානව හිමිකම් සම්බන්ධයෙන් කටයුතු කරන එක්සත් ජාතීන්ගේ ප්‍රධානතම යාන්ත්‍රණයකි. මෙම කවුන්සලය රාජ්‍ය නියෝජිතයන්ගෙන් සමන්විත වේ. කවුන්සලයේ සාමාජිකයන් ගණන 47කි. වසරකට තුන්වරක් රැස්වී මානව හිමිකම් සම්බන්ධයෙන් සාමාජික රාජ්‍යයන්ගේ තත්ත්වයන් මෙන්ම විවිධ අංශ කෙරෙහිද සාකච්ඡා කරනු ලබයි. මෙම කවුන්සලයේ සැසිවාරවලට සමාන්තරව රාජ්‍ය නොවන සංවිධාන විසින් විවිධ තේමාවන් සහ රාජ්‍යයන් සම්බන්ධයෙන් සැසිවාරයන්ද පවත්වනු ලැබේ.

## අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ වාර්තාකරු
## *(UN Special Rapporteur on Freedom of Opinion and Expression)*

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසම විසින් 1993 වසරේදී මෙම තනතුර ස්ථාපනය කරන ලදී. ජාත්‍යන්තර නීතියට අනුව අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස ආරක්‍ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම මෙම විශේෂ වාර්තාකරුගේ කාර්යයි.

අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසම වෙත වාර්තා ඉදිරිපත් කරන අතර, අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය කඩවන අවස්ථාවන්වලදී එම තත්ත්වයන් පිළිබඳව ජාත්‍යන්තර අවධානය යොමු කිරීම මෙම විශේෂ වාර්තාකරු විසින් සිදුකරනු ලබයි.

මෙම විශේෂ වාර්තාකරුගේ ලිපිනය

Special Rapporteur on the promotion and
protection of the right to freedom of o
pinion and expression
c/o Office of the High Commissioner for Human
Rights
United Nations Office at Geneva
1211 Geneva 10, Switzerland
Fax: +41 22 917 9003

## එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුව
## *(UN Human Rights Committee (HRC)*

සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතියේ සඳහන් අයිතිවාසිකමක් යම් රාජ්‍යයක් විසින් උල්ලංඝනය කරන අවස්ථාවකදී එම රාජ්‍යයේ පුරවැසියකුට මෙම කමිටුව වෙත පැමිණිලි කළ හැකිය.

නමුත් එසේ පැමිණිලි කිරීමට ප්‍රථම දේශීය වශයෙන් ලබාගත හැකි උපරිම සහනයක් සඳහා යොමු වී තිබිය යුතුය. මෙම කමිටුව මානව හිමිකම් පිළිබඳ විශේෂඥ විනිසුරුවරුන්ගෙන් සමන්විත ආයතනයකි. පැමිණිලිකරුගේ සහ රාජ්‍ය පාර්ශ්වයේ කරුණු විමසා බලා නිර්දේශ නිකුත් කිරීම සිදුකරනු ලබයි.

Secretary Human Rights Committee
Room D-204
Support Services Branch
Office of the High Commissioner for
Human Rights
Palais des Nations
1211 Geneva 10
Switzerland
Tel: +41 22 917 3965
Fax: +41 22 917 0099
E-mail: etistounet.hchr@unog.ch

# සටහන්

# 15.

# අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය වෙනුවෙන් කටයුතු කරන ජාත්‍යන්තර සංවිධාන

**Article 19**

72 Rosbery Avenue,

London.

EC1R 4RR

Tele: +442073242500

Twitter: @article19org

Facebook: Article19org

Email: info@article19.org

---

**Amnesty International**

M.Thai Tower, All Seasons Place,

87 Wireless Road, Lumpini, Phatumwan,

Bangkok, THAILAND 10330

Telephone: +66(0)987543995

Fax: +66-29392534

Email: infor.eseaprobangkok@amnesty.org

(For East and East Asia and the Pacific)

**Reporters Withuot borders**

CS 90247

75083 Paris Cedex 02

(+33) (0)1 44 83 60 56 or (+33) (0)1 44 83 84 66

assistance@rsf.org and assistance2@rsf.org

.................................................................................

**International Federation of Journalists**

IPC-Residence Palace

Rue de la Loi 155

B-1040 Brussels, Belgium

+32 (0)2 235 22 00

+32 (0)2 235 22 19

Email: ifj@ifj.org

.................................................................................

**International Press Institute**

Phone: +4315129011

Fax: +4315129014

Email: infor(at)ipi.media

Web: ipi.media

# 16.

# ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක මාධ්‍ය සංවිධාන

**නිදහස් මාධ්‍ය ව්‍යාපාරය**
අංක 96, කිරුළ පාර,
කොළඹ-05
දුරකථනය-011 2368895
Email: fmmsrilanka@gmail.com

**තරුණ ජනමාධ්‍යවේදීන්ගේ සංගමය**
අංක 176/3ඒ,
ඔරුතොට, ගම්පහ.
දුරකථය-07710661417
Email: web.yjasl@gmail.com

**ශ්‍රී ලංකා වෘත්තීය පත්‍රකලාවේදින්ගේ සංගමය**
නො 276/3,ප්‍රදීපා මාවත, මාලිගාවත්ත, කොළඹ-10
දුරකථනය - 011 2439276, 011 2197094
Email: slworkingjournalist@gmail.com

**ශ්‍රී ලංකා මුස්ලිම් ජනමාධ්‍ය සංසදය** (SLMMF)
41/2, විජිත පාර, නැදිමාල, දෙහිවල.
Email:  muslimmediaforum@gmail.com

**මාධ්‍ය සේවක වෘත්තීය සමිති සම්මේලනය** (FMETU)
අංක 30, අමරසේකර මාවත,
කොළඹ-05.
077-3641111
Email : info@fmetu.org

**ශ්‍රී ලංකා ද්‍රවිඩ මාධ්‍ය සංවිධානය** (SLTJ)
අංක 185. ග්‍රෑන්පාස් පාර,
කොළඹ-14
Email : gajan75@gmal.com

**දකුණු ආසියානු නිදහස්**
**මාධ්‍ය සංගමය(ශ්‍රී ලංකා පාර්ශ්වය)**
107 ඔබේසේකරපුර, රාජගිරිය.
Email : safmasrilanka@gmail.com

# 17.

# අවශ්‍ය විය හැකි වෙබ් අඩවි

**ශ්‍රී ලංකා පොලිසිය**
https://www.police.lk

**ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය**
https://slpi.lk

**ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය**
https://www.slpc.lk

**ජනමාධ්‍ය අමාත්‍යාංශය**
https://media.gov.lk

**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව**
https://www.dgi.gov.lk
https://rti.gov.lk

**රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව**
http://www.documents.gov.lk

**අධිකරණ අමාත්‍යාංශයේ නීති වෙබ් අඩවිය**
https://www.lawnet.gov.lk

**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව**
https://www.parliament.lk

**මාධ්‍ය නීති සංසදය**
https://www.medialawforum.org

# 18.

# හදිසි
# ඇමතුම් අංක

පොලිස් හදිසි ඇමතුම
**119**

---

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
**1996**

---

ශ්‍රී ලංකා නීතිඥ සංගමය
**0112447134**

---

නීති ආධාර කොමිෂන් සභාව
**0112433618**

---

ජාතික පොලිස් කොමිෂන් සභාව
**0112166503**

---

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
**0112515759**

# මාධ්‍ය නීති

**ජනමාධ්‍යවේදීන්ගේ නීති අත්පොත**

අද, නීත්‍යනුකූල සහ
සාමකාමී ප්‍රකාශනය මැඬලීමේ
ප්‍රතිඵලය විය හැක්කේ,
නොවැළැක්විය හැකි ලෙස,
වෙනත් දවසක ප්‍රචණ්ඩත්වයේ
ව්‍යසනකාරී පිපිරීමක් පමණී.
රජය සහ දේශපාලන පක්ෂ සහ
ප්‍රතිපත්ති විවේචනය කිරීම,
ව්‍යවස්ථාවේ 14(1)(අ) වගන්තිය යටතේ
භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහස
භාවිත කිරීමට අවසර ලත් ක්‍රියාවක් බව,
පොලිස්පතිවරයා ස්ව කැමැත්තෙන්
සියලු පොලිස් ස්ථාන භාර නිලධාරීන්ට
සුදුසු උපදෙස් සහ නියෝග
නිකුත් කරනු ඇත.

**ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු**
**මාර්ක් ප්‍රනාන්දු අමරසිංහ එදිරිව**
**සිරිමල් නඩු තීන්දුවේදී**

ISBN 978-624-6375-00-3

**මාධ්‍ය නීති සංසදය**
අංක 170, පළමු මහල,
අලුත්කඩේ වීදිය, කොළඹ 12.
දුරකථන-0743070888
Info@medialawforum.org
prabodha@medialawforum.org